ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු ,

විධායක අධ්‍යක්ෂ

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

## නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා වන යෝජනා !

රටක් ලෙස ඉදිරියට යාමේදී සමාජයේ පවතින යම් පසුගාමී හා අගතිගාමී ලක්ෂණ හා තත්වයන් බාධාකාරී ලෙස හරස් වන බව අවබෝධ කරගෙන ඇති බැවින් ඊට එරෙහි අරගලයක හා සමාජ කොටස් දැනුවත් කිරීමේ ව්‍යායාමයක ශ්‍රී ලංකා හේතුවාදී ව්‍යාපාරය ලෙස අපි නියලී සිටින්නෙමු.

නව ආණ්ඩුක්‍රම ව්යවස්ථාවක් සඳහා වන සංවාදයක් ගොඩනැගීමට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ගන්නා වෑයම විශේෂයෙන් වැදගත් වන අතර ඊට අපගේ ප්‍රශංසාව හිමිවිය යුතුය. මෙම සංවාදය සමාජයේ දැනුවත් සීමිත පිරිසක් අතරේ පවතින ප්‍රස්තුතයක් වනමුත් සමාජ ව්‍යාපාරයක් ලෙස ඊට යම් මැදිහත් වීමක් හෝ යෝජනා ඉදිරිපත් කිරීමක් හෝ අපගේ පාර්ශවයෙන්ද විය යුතු වෙයි.

සමාජයේ පවතින අවිචාරය, අගතිගාමිත්වය හෝ මිත්‍යාව පරාජය කිරීම හුදෙක් ව්‍යවස්ථාමය මැදිහත්වීමක් තුලින් සපුරා ගතහැකි අභියෝගයක් නොවනමුත් ඉදිරිගාමී හා නූතන ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණයක් විසින් සමාජය ඊට සූදානම් කිරීමක් වනු ඇත. අගතිගාමී , පසුගාමී සමාජ තත්වයන්ට අනුබලදෙන්නාවූ සමාජ දේශපාලන පසුබිම / ඉඩකඩ අහුරන එමෙන්ම නෛතික හිස්තැන් අවම කරන විස්තරාත්මක ආණ්ඩුකරන ප්‍රතිසංස්කරණ පියවරකට අප යායුතුවෙයි.

අපගේ පාර්ශවයෙන් ඉදිරිපත් කිරීමට අදහස් කරන මුලික කරුණු කීපයක් මෙසේ ඔබේ අවධානය පිණිස යෝජනා කරමු.

1. ආගම හා රාජ්‍යය එකිනෙකින් ස්වාධීන කිරීම

   ආගම පුද්ගලික යාමකි. රාජ්‍යය යනු පොදු සමාජ සංස්ථාවකි. එම පොදු සමාජ සංස්ථාව සමන්විත වන්නේ , නියෝජනය කරන්නේ ,අභිනියෝජනය කරන්නේ සියලු ජනවාර්ගික කොටස් හා සියලු ආගමික කොටස් වලිනි. එවිට එක් ආගමක් විශේෂ විය නොහැක. 80 % හින්දු ආගමිකයින් සිටින ඉන්දියාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනාගමික එකකි. ඉන්දියාවේ ආගමික කුපිත කිරීමක් ඇති කිරීමේ විභවය ශ්‍රිලංකාවේ එම තත්වයට වඩා වැඩි පසුබිමක් යටතේ වුව එවැනි නිර්භීත තීන්දුවකට ඔවුන් අතීතයේදීම එළඹ ඇත. අනෙක් අතට ආගමක් විසින් රාජ්‍යයේ රැකවරණය හා අනුග්‍රහය පැතීම යනු අසරණ භාවයක් වැනි පිළිබිඹුවකි. ආගමික ආයතන වල සිටින උගත් පූජ්‍ය පක්ෂය ඇත්තෙන්ම තම අවධානය යොමුකළ යුතු කාරණය වන්නේ ආගමේ පෞරුෂය ආරක්ෂා කල යුත්තේ රාජ්‍යයේ රැකවරණය / පිහිට නොමැතිවයි යන යථාර්තය තෙරුම්ගනිමිනි. මන්ද අතීතයේ මෙන් ආගම්වලට තර්ජන එල්ල වන තත්වයක් අද අපේ රටේ නැත.

2. ජනමාධ්‍ය සමජයට වගවියයුතුයි

ජනමාධ්‍ය යනු සමාජයට විශාල වශයෙන් බලපෑම් සහගත සන්නිවේදකයෙකි. බොහෝ ජනමාධ්‍ය ක්‍රියාත්මක වනුයේ ව්‍යාපාරික අරමුණු පෙරදැරි කරගත් තරඟකාරී විලාසයකිනි. එහිදී මාධ්‍ය සතු සමාජ වගකීම හා වගවීම නොතකා කටයුතු කරන ආකාරය අපගේ නිරීක්ෂණයයි. ධනවත් ව්‍යාපාර විසින් ඉතා ප්‍රාථමික අයුරින් සමහර මාධ්‍ය ආයතන හසුරුවන ආකාරයද රහසක් නොවේ. ඊට වඩා අනතුරුදායක භාවිතාව වන්නේ සමාජය මිත්‍යාවේ හා අවිචාරයේ ගොදුරක් බවට පත්කරන්නාවූ පසුගාමී ගර්හිත භාවිතාවක සමහර ජනමාධ්‍ය නියැලීමයි. දියුණු සමාජ වල ජනමාධ්‍ය වලට එලෙස සමාජය අගතිය කරා යොමු කරන සන්නිවේදනයක නියැලීමේ වගකීම් විරහිත ඉඩකඩක් ඉතිරිකොට නැත. ජනමාධ්‍ය වලට තමන් සතු වගකීම් හා මාධ්‍ය ආචාරධර්ම නොතකා කටයුතු කරන්නට ඇති ඉඩකඩ නීති මගින් හෝ රීති මගින් නියාමනය කලයුතුය. එසේ නොවුවහොත් ඉන් සමාජයට වන අගතිය ඊට වඩා නරක ප්‍රතිවිපාක ඇතිකරන්නක් වෙයි. ඒ අනුව ජනමාධ්‍ය විසින් තමන් සන්නිවේදනය කරන සංවේදී පුවත් පිළිබඳව සමජයට වගවියයුතු බවට වන නෛතික ප්‍රතිපාදන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණක් තුලින් ඇතුලත් වියයුතු බවට යෝජනා කරමු.

3. විද්‍යාත්මක චින්තනය ප්‍රවර්ධනය කිරීමට අනුග්‍රහය දීම රාජ්‍ය සතු වගකීමක්

අධ්‍යාපනය යනු රටක ප්‍රගතිය හා ගුණාත්මක තත්වය අරබයා කෙරෙන ප්‍රමුඛතම ආයෝජනයයි. එම අධ්‍යාපනය තුලින් තනන පුරවැසියාගේ ගුණාත්මක මට්ටම, රටේ පවතින අධ්‍යාපන තත්වය පිලිබඳ මිනුම් දණ්ඩක් වනු ඇත. අපේ රටේ පුරවැසියාගේ විචාර බුද්ධිය හා මානවීය දර්ශකයේ මට්ටම මීට දශක දෙක-තුනකට පෙර පැවති තත්වයට වඩා පසුපසින්ය යන්න අපගේ අනෙක් නිරීක්ෂණයයි. එනිසා අධ්‍යාපනය යන මූලික මානව හිමිකම වෙනුවෙන් වඩා අර්ථාන්විත හා පලදායක ප්‍රතිසංස්කරණ ආවරණය කරන්නාවූ ව්‍යවස්ථාදායක ප්‍රතිපාදන මෙම ප්‍රතිසංස්කරණ සංවාදයට ඇතුලත්විය යුතු බවට යෝජනා කරමු. උදාහරණ වශයෙන් ඉන්දියානු ව්‍යවස්ථාව තුල විද්‍යාත්මක චින්තනය ප්‍රවර්ධනය කිරීමට අනුග්‍රහය දීම රාජ්‍ය සතු වගකීමක් බවට වන ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ඇතුලත් වෙයි. ඉන්දියාවේ පවතින මහා මිථ්‍යාවන්ට එරෙහිව අරගල කරන සමාජ ව්‍යාපාර වලට එතුලින් යම් අනුග්‍රහයක් ලැබී ඇත. එවැනි ප්‍රතිපාදනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් වීම ඒ දෙසට වන ව්‍යායාමයකට වැදගත් පියවරක් වනු ඇති අතර සමාජයේ අවධානය පිණිස නිමිත්තක්ද වනු ඇත.

4. තහවුරු නොකළ ප්‍රතිකාර ක්‍රමවේද අභ්‍යාස කිරීමට ඇති ඉඩකඩ නියාමනය කිරීම

පවතින සාමාන්‍ය නීතිය අනුව රෝගයකට/රෝගියෙකුට ප්‍රතිකාර කල හැකි වන්නේ වෛද්‍ය සභාවක ලියාපදිංචි සුදුසුකම්ලත් වෛද්‍යවරයෙකුට පමණි. එහෙත් තවමත් එවැනි සුදුසුකම්ලත් නොමැති විවිධ අයගෙන් ප්‍රතිකාර ලබාගෙන නරක ප්‍රතිවිපාක උරුම කරගැනීමත් එය පෙරලා අමතර සෞඛ්‍යමය ගැටළුවක් බවට පත්වීමත් අපට අත්දකින්නට ඇති කාරණයකි. මෙවැනි අනුවන ප්‍රතිකාර ක්‍රම වලට යොමුවී ඊටත් වඩා බරබතල ඛේදවාචක වලින් කෙලවර වූ අවස්ථාද හිඟ නොවන වගද එමෙන්ම අප දන්නා යතාර්තයකි. ඒ අනුව මෙම කාරණය බරපතල ලෙස අදාළ බලධාරීන්ගේ අවධානයට ලක්විය යුතු, මහජනතාවගේ

ජීවිතය පිළිබඳ කරුණක් වුවද ඊට නිර්භීත ලෙස පිළියම් සෙවූ ආකාරයක් මෙතෙක් දක්නට නැත. ව්‍යවස්ථාව තුළින්ම මෙවැනි අනතුරුදායක ප්‍රතිකර්ම වලට ( තහවුරු නොකළ ප්‍රතිකාර ක්‍රමවේද අභ්‍යාස කිරීමට) ඇති ඉඩකඩ අහුරන නෛතික ප්‍රතිපාදන රටේ මූලික නීතිය මගින්ම ස්ථාපිත කල යුතු බවට යෝජනා කරමු.

තාරක වරාපිටිය
ලේකම්
ශ්‍රීලංකා හේතුවාදී සංගමය
2015-10-16
( දූ.අංකය 0727 449 599 )